**වෘත්තීය වෙබ් මාධ්‍යවේදීන්ගේ සංගමය**
தொழில்முறை இணைய ஊடக அமைப்பு
**Professional Web Journalist Association**

# වෙබ් මාධ්‍ය
# ආචාරධර්ම සංග්‍රහය

හැ ඳි න් වී ම

වෙබ් ජනමාධ්‍යවේදය යන්න සම්පූර්ණයෙන්ම මාර්ගගතව, අන්තර්ජාලයෙහි ලෝක ව්‍යාප්ත ජාලය තුළින් පාඨ, ඡායාරූප, ශබ්ද ගොනු සහ වීඩියෝ යනාදිය මහජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම අරමුණු කරගනිමින්, තනි පුද්ගල හෝ සාමූහික පිරිසකගේ භාවිතය හරහා සිදුකෙරෙන සන්නිවේදන ක්‍රියාවලියක් වශයෙන් අර්ථ නිරූපනය කෙරෙනු ලැබේ.

අතීතයේ සිට ප්‍රවෘත්ති, කාලීන සිදුවීම්, වෙනත් දැනුම සහ තොරතුරු ජනතාව වෙත සම්ප්‍රේෂණ කරන ලද්දේ මුද්‍රිත මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය මඟිනි. එහෙත් අද වන විට එම කාර්ය සිදු කිරීමේ වඩාත් ප්‍රචලිත ක්‍රමය වී ඇත්තේ තාක්ෂණය හා මුසුව සයිබර් අවකාශය ඔස්සේ දැනුම සහ තොරතුරු ලබා දීමයි.

මෙය විද්‍යුත් පුවත්පත ලෙසද හඳුන්වාදිය හැකිය.

පහත ආචාරධර්ම සංග්‍රහය තුළින් වෙබ් මාධ්‍යවේදය යනුවෙන් එන වඩාත් පොදුවේ පිළිගත් ව්‍යවහාරය භාවිත කෙරෙන අතර එයට ඉහත අර්ථ දැක්වීම් හරහා වෙබ් මාධ්‍ය වශයෙන් හැඳින්වෙන සහ එකී මාධ්‍ය වර්ගීකරණය යටතට ගැනෙන ඕනෑම භාවිතයක් ඇතුළත් වනු ඇත.

මෙම ආචාරධර්ම සංග්‍රහය මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් යනාදී ඕනෑම මාධ්‍ය ක්‍රියාවලියක ආචාරධර්ම මූලික කරගත් භාවිතය සහතික කරන්නා වූ ප්‍රධානතම උපකල්පනය පදනම් කරගෙන ගොඩනැගී ඇත.

මහජනතාව වෙනුවෙන් සත්‍යය නිරාවරණය කිරීම සහ තමන් වටා ගොඩනැගෙන්නාවූ සිදුවීම් පිළිබඳව, අදාළ සිදුවීම්වලින් ඔහුට/ඇයට ඇතිවිය හැකි බලපෑම පිළිබඳව සහ ගුණාත්මක ජීවන පැවැත්මක සාමූහික සන්දර්භය වන ඔහු/ඇය ජීවත්වන සමාජයට එවැනි සිදුවීම්වලින් ඇතිවිය හැකි බලපෑම පිළිබඳව සැබෑ තොරතුරු දැනගැනීම පිණිස මහජනතාවට අවකාශය සැලසීම ඉහත කී ඕනෑම ජනමාධ්‍යයක කාර්යභාරය වේ යන්න එකී උපකල්පනයයි.

## 1. කෙටි භාවිතයන්

වෙබ් මාධ්‍යවේදය සඳහා වන ආචාරධර්ම සංග්‍රහය යන නමින් වන මෙම ලේඛනය භාවිතයේ පහසුව පිණිස, මින් ඉදිරියට, වෙබ් මාධ්‍ය ආචාරධර්ම යනුවෙන් ව්‍යවහාර කෙරෙනු ඇත. (විද්‍යුත් පුවත්පත් අචාරධර්ම)

## 2. වගකීම්

පහත වෙබ් මාධ්‍ය ආචාරධර්ම වෙත අනුකූල වීමේ මූලික වගකීම වෙබ් අඩවි සහ සියලු ආකාර  ලිපි, විශේෂාංග, ප්‍රවෘත්ති, තොරතුරු, ඡායාරූප, හඬ පට සහ වීඩියෝ යන මේවා සපයන සියලුම පුද්ගලයන් වෙත පැවරේ.

එසේම එවැනි ජනමාධ්‍යවේදීන්ගේ සංවිධාන සහ සමූහයන් වෙතද, කාලීන සහ ඇතිවන්නාවූ සිදුවීම් සම්බන්ධයෙන් මහජන අවබෝධය ඇතිකිරීම, සංවාදයන් ගොඩනැගීම සහ ඒවා පිළිබඳ තොරතුරු, දැනුම හා ප්‍රවෘත්ති බෙදාහැරීම සිය මූලික අරමුණ කරගත් ප්‍රවෘත්තිමය වෙබ් අඩවි ද මෙම ආචාරධර්ම වෙත අනුකූල වීමට එකසේ වගකීම් දරනු ලැබේ.

එසේම දෙන ලද ඕනෑම අවස්ථාවක එවැනි වෙබ් අඩවිවල පවතින තොරතුරු සම්බන්ධයෙන් ඒවායේ නීතිමය හිමිකාරීත්වය දරන්නන්, කතෘවරු සහ/හෝ එවැනි වෙබ් අඩවිවල පරිපාලක කාර්යය (web Admin ) සිදුකරන්නන් විසින් මුළුමනින්ම වගකිව යුතුය. එවැනි වෙබ් අඩවියක් වෙත තම නමින් යුතුව එක්කරන්නාවූ ඕනෑම ආකාරයක අන්තර්ගතයක් සම්බන්ධයෙන් වන වගකීම අදාළ මාධ්‍යයෙහි සංස්කාරකවරයා/ප්‍රකාශකවරයා (web Admin) /හිමිකරු යන මේ අය විසින් ද දැරිය යුතුවේ.



## 3. තොරතුරු සහ ප්‍රවෘත්ති වාර්තාකරණය

ඉලෙක්ට්‍රෝනික සහ මුද්‍රිත යන දෙයාකාරයේම මාධ්‍ය සමග සන්සන්දනාත්මකව බලන කළ වෙබ් ප්‍රවේශයන් හරහා තොරතුරු වාර්තාකිරීම යනු අසාමාන්‍ය තරමේ වේගයකින් යුත් කාර්යක්ය යන්න පොදුවේ පිළිගැනේ.

එලෙසින්ම, භූගෝලීය දේශසීමා බාධක ඉක්මවා යන්නටත් එතැනින්ද නොනැවතී උසස් තාක්ෂණික ක්‍රියාදාමයන් හරහා සිය අදාළත්වය ඉහළ නංවාගන්නටත් සමත්වූ සන්නිවේදන ව්‍යුහයන්ගෙන් සමන්විතව විශ්ව ගම්මානයක් බවට පත්වූ ලෝකය තුළ වඩාත් වේගයෙන් සහ සියල්ලන්ටම ප්‍රථමයෙන් තොරතුරු සහ ප්‍රවෘත්ති ලබාදෙන්නා බවට පත්වීමේ තරගයක්ද ජනමාධ්‍ය ආයතන අතර සහ ඒවා අභ්‍යන්තරයෙහි ගොඩනැංවී ඇත.

ෆෙස්බුක්, යුටියුබ්  සහ ට්විටර් වැනි සෙසු සමාජ මාධ්‍ය භාවිත කරමින් සාමාන්‍ය ප්‍රමාණයටත් වඩා පුළුල් පැතිරීමක් අත්පත් කරගැනීමේ අමතර හැකියාව ද වෙබ් ජනමාධ්‍ය සතුව ඇත. වෙබ් මාධ්‍ය සතු මෙම ගුණාංග මතින් නිර්මාණය කෙරෙනුයේ කිසියම් අන්තර්ගතයක් වෙබ් මාධ්‍යයක් වෙත එක් කරන ඕනෑම ජනමාධ්‍යවේදියෙකුගේ පාලනයෙන් ගිලිහී යාහැකි ආකාරයේ තත්ත්වයකි.

වෙබ් මාධ්‍ය භාවිතය තුළ මෙතරම් තරගකාරී සහ පාලනය කළ නොහැකි තරම් වේගයෙන් වෙනස්වෙන සුළු ස්වභාවයක් පවතින බව සත්‍ය වුවද ස්වඅභිමතය පරිදි අන්තර්ජාලයේ සැරිසරන්නන් වන සමාජය සහ මහජනතාව වෙත වෙබ් ජනමාධ්‍යවේදීන්/වේදිනියන් විසින් දැරිය යුතු වගකීම අඩුවීමට එකී ස්වභාවය හේතුවන බවක් එයින් අදහස් නොවේ.

වෙබ් මාධ්‍ය වෙත එක් කෙරෙනු ලබන අන්තර්ගතයන් ඕනෑම අවස්ථාවක අනපේක්ෂිත තරම් පැතිර යාහැකි වීමේ ගුණය යනු වෙබ් ජනමාධ්‍යවේදීන්/ වේදිනියන්ට තම තමන්ගේ වෙබ් අඩවි තුළ ප්‍රකාශ කරනු ලබන කාරණා සම්බන්ධයෙන් වඩාත් බරපතල ලෙස සිතන්නටත් වගකීම ගන්නටත් හේතුවක්මය.

වෙබ් මාධ්‍ය භාවිතයෙහි නියැලීම සිදුවිය යුත්තේ මෙකී සියලු කාරණයන් නිසි අවධානයට ලක්කිරීමෙන් අනතුරුවය.

**3.1. ප්‍රවෘත්ති සහ තොරතුරු එක්රැස්කිරීම.**

**3.1.1.** නව තොරතුරු, ප්‍රවෘත්ති, විශේෂාංග හෝ තොරතුරු මූලාශ්‍ර යන මේවා පුද්ගලයෙකුගෙන්, සමූහයකින් හෝ සංවිධානයකින් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් කිසිදු වෙබ් ජනමාධ්‍යවේදියෙකු/වේදිනියක යම් පුද්ගලයෙකුගේ, සමූහයකගේ හෝ ආයතනයක කීර්තිනාමය පළුදු කරන්නේ යැයි ඔවුනට බිය ඇතිකිරීම, බලකිරීම හෝ යම්කිසි ආකාරයක තර්ජනයන් සිදුකිරීම යන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ නොවිය යුතුය.

**3.1.2.** කිසියම් තොරතුරක් හෝ ප්‍රවෘත්තියක් හෝ සපයන ලද මූලාශ්‍රමය පුද්ගලයෙකුගේ අනන්‍යතාවය හෙළිකිරීමෙන් එම පුද්ගලයාට සෘජු හෝ වක්‍රව හානියක් ඇති නොවන අවස්ථාවක දී ද, ඔහුගේ/ඇයගේ පවුලට, එයින් ඔහුගෙන්/ඇයගෙන් යැපෙන්නන්ට, සමීප පුද්ගලයන්ට හෝ වෘත්තීයමය සගයනට යන මේ අයට හානියක් ඇති නොවන්නාවූ අවස්ථාවකදී ද, සිය අනන්‍යතාවය හෙළි නොකරන්නැයි අදාළ මූලාශ්‍රගත පුද්ගලයා විසින් විශේෂයෙන් ඉල්ලීමක් කර නොමැති අවස්ථාවකදී ද යන මෙම සියලු අවස්ථාවන්හිදී පළ කෙරෙන තොරතුර හෝ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් මූලාශ්‍රය කවරක් ද යනවග දැක්විය යුතුය.

**3.1.3.** ඕනෑම ආකාරයක තොරතුරක්, ප්‍රවෘත්තියක් හෝ ප්‍රවෘත්තිමය විශේෂාංගයක්, ඡායාරූප ද ඇතුළුව මහජනතාවට ප්‍රවේශ විය හැකි පරිදි ප්‍රකාශ කෙරෙන අවස්ථාවක එය සිදුකළ යුත්තේ අදාළ පළකිරීමෙහි අන්තර්ගතයෙහි නිරවද්‍යතාවය පිළිබඳ විවිධ කෝණයන්ගෙන් සලකා බැලීමෙන් අනතුරුවය.

යම් හෙයකින් එවැනි සලකා බැලීමක් කළ නොහැකි අවස්ථාවක් පැමිණියේ නම් එහිදී අදාළ වෙබ් මාධ්‍යයෙහි සංස්කාරකවරයා/ප්‍රකාශකවරයා (web admin)/හෝ හිමිකරු යන මේ අය අතරින් යමෙක් අදාළ අන්තර්ගතයෙහි මූලාශ්‍රයේ වලංගුභාවය පිළිබඳ සහතික වියයුතු අතර පළ කෙරෙන්නේ කවරක්ද එය පිළිබඳ පූර්ණ වගකීම ද දැරිය යුතුය.

**3.1.4** උපුටා ගැනීමක් සිදුකරන අවස්ථාවකදී ඒහි මුල් හිමිකරීත්වයට නිසි තැන ලබා දිය යුතුය.

**3.2. දෝෂ, අඩුපාඩු සහ නිවැරදිකිරීම්.**

**3.2.1.** මහජනතාවට ප්‍රවේශ වියහැකි පරිදි ප්‍රසිද්ධ කරන ලද කිසියම් අන්තර්ගතයක යම් දෝෂයක් හෝ අඩුපාඩුවක් දුටුවේද, මුල් පළකිරීම නැවත සකස්කරනු වෙනුවට පරිශීලකයන්ගේ අවධානයට යොමුවන පරිදි, අදාළ වරද සම්බන්ධයෙන් පරිශීලකයන්ගෙන් සමාව ඉල්ලා සිටීමේ නිවේදනයක් ද සහිතව, දෙවැනි අන්තර්ගතයක් පළකරන්නට වහාම කටයුතු කරන්නට ද වෙබ් මාධ්‍යයෙහි සංස්කාරකවරයා/ප්‍රකාශකවරයා/හෝ පරිපාලකවරයා යන මේ අය අතරින් යමෙක් කටයුතු කළ යුතුය. පළකිරීමක වන කිසියම් දෝෂයක් හෝ අඩුපාඩුවක් නිවැරදිකිරීමෙහිලා ප්‍රථමයෙන් එවැනි වරදක් සිදුව ඇති බව ඉහත සඳහන් අය විසින් පිළිගැනීම අත්‍යවශ්‍ය වේ.

**3.2.2.** යම්කිසි දෝෂයක් හෝ අඩුපාඩුවක් සිදුව ඇත්තේද, එම වරද අගතියට පත් යම් පාර්ශ්වයක් විසින් සංස්කාරකවරයා/ප්‍රකාශකවරයා/හෝ පරිපාලකවරයා යන මේ අය අතරින් යමෙකුගේ අවධානයට ලක්කරන ලද අවස්ථාවෙක, එම වෙබ් මාධ්‍ය හරහාම තමන් වෙනුවෙන් කරුණු දැක්වීමට එකී අගතියට පත් පාර්ශවයට ඇති අයිතිය පිළිගන්නට ඔවුන් විසින් කටයුතු කළ යුතුය.

එසේම එවැනි අවස්ථාවක, මුල් පළකිරීම සඳහා දෙන ලද ප්‍රමුඛතාවයට එලෙසින්ම සමාන ප්‍රමුඛතාවයක් දෙමින් අගතියට පත් පාර්ශ්වයේ කරුණු දැක්වීමද ප්‍රසිද්ධ කරන්නට කටයුතු කළ යුතුය. (මෙම නිවැරදි කිරිම ප්‍රමුඛ පුවතක් ලෙස වාර්තා කළ යුතුය)

**4. මූලාශ්‍රයන්හි විශ්වසනීයත්වය.**

තොරතුරු ලබාදෙන කිසියම් පුද්ගලයෙකු විසින් සිය රහස්‍යභාවය සහ ආරක්ෂාව සහතික කර දෙන්නැයි විශේෂයෙන් ඉල්ලා සිටින ලද අවස්ථාවක වෙබ් මාධ්‍යයෙහි සංස්කාරකවරයා/ප්‍රකාශකවරයා/හෝ පරිපාලකවරයා ද අන්තර්ජාලය පදනම් කරගෙන ජනමාධ්‍ය භාවිතයෙහි නිරත සියලු වෙබ් ජනමාධ්‍යවේදීන්/වේදිනියන් ද අදාළ පුද්ගලයාගේ රහස්‍යභාවය හා ආරක්ෂාව සහතික කිරීමට යුතුකම අතින් ද සදාරචාරමය හරයන් අතින්ද බැඳී සිටී.

**5. වාර්තාකරණයෙහි සමාජ වගවීම.**

**5.1.** දාමරික ක්‍රියාකාරකම්, ප්‍රචණ්ඩ ක්‍රියා, මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි, කෲරත්වයන්, පරපීඩාකාම ක්‍රියාවන්, කාමය මුල්කරගත් දාමරිකකම්, ව්‍යාභිචාරයන්, ළමා අපචාර සහ ළමයින්ට අශ්ලීලකම් පෑම වැනි සමාජය තුළ ප්‍රකම්පනයන් ජනිත කළ හැකි, හැඟීම් අතින් වේදනාකාරී හෝ එවැනි සිද්ධියකට ගොදුරු වූ කිසියම් හෝ පුද්ගලයෙකුගේ රහස්‍යත්වය හානි විය හැකි අවස්ථාවක තොරතුරු වාර්තාකිරීමේදී විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. එවැනි සිදුවීමක් ආශ්‍රිතව වාර්තාකරණයේ වගකීම් ජනතාව වෙත ඉටුවිය යුත්තේ කරුණු හෝ මත පළකිරීම්, ඡායාරූප පළකිරීම, සහ රූප සටහන් ආදිය පළකිරීම උචිත සංවේදීතාවයක් සහ රහස්‍යත්වය නඩත්තුවන පරිද්දෙන්ය.



**5.2.** වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් ජනමාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදියෙකු/වේදිනයක දැනුවත්ව, සිතාමතා, අපරික්ෂාකාරී නොසැලකිලිමත්භාවයෙන් හෝ අනවධානයෙන් ක්‍රියාකිරීමෙන් පළ කරන වාර්තා හරහා ජනවාර්ගික හෝ ආගමික සංකුලතා ඇතිකිරීමට, ද්වේශයන් හෝ ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිකිරීමට හෝ ඇතිව තිබෙන එවැනි තත්ත්වයක් වැඩිදියුණු වීමට හේතුවන ලෙස කටයුතු නොකළ යුත්තේය.

**5.2.1.** වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් ජනමාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදියෙකු/වේදිනියක යම් පුද්ගලයෙකුගේ ජනවර්ගය, ශරීර වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය, ලිංගිකත්වය, ශාරීරික හෝ මානසික රෝගයක් හෝ අබලතාවයක් සම්බන්ධයෙන් අගතිගාමීව හෝ අවමන් සහගතව සඳහන්කිරීම නොකළ යුතුය. එසේම යමෙකුගේ ජනවර්ගය, කුලය, ලිංගික අනන්‍යතාවය, ශාරීරික හෝ මානසික රෝගයක් හෝ අබලතාවයක් යන මේ කිසිවක් සම්බන්ධයෙන් වාර්තා කරන ප්‍රවෘත්තියට හෝ විශේෂාංගයට ඍජුවම අදාළ වන අවස්ථාවක හැර අන් කිසිදු අවස්ථාවක සඳහන් නොකළ යුතුය.

**5.3.** වාණිජ ආයතනයන්හි මූල්‍යමය ගනුදෙනු සම්බන්ධයෙන් හෝ මූල්‍ය හෝ මූල්‍ය නොවන කාරණා සම්බන්ධයෙන් යමෙකුගේ පුද්ගලික සහ පෞද්ගලිකත්වය සම්බන්ධ තොරතුරු යම් වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් ජනමාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදියෙකු/වේදිනියක සතුව තිබෙන්නේද කිසිම අවස්ථාවක එකී තොරතුරු අදාළ වෙබ් ජනමාධ්‍යවේදියාගේ පුද්ගලික වාසිය හෝ ලාභ ඉපයීම පිණිස යොදාගැනීම නොකළ යුතුය.

**5.4.** වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් මාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදින්/වේදිනියන් යන සියල්ලන්ම හදිසි අනතුරු, රිය අනතුරු සහ පැහැරගෙන යාම් සම්බන්ධ පුවත් වාර්තාකිරීමේදී යොදා ගන්නා ඡායාරූප සහ වීඩියෝ පට මහජන භීතියට හා පිළිකුලට භාජනය නොවන සහ සංස්කරණයකින් තොරව පල කිරීමෙන් වැළකිය යුතු අතර භාෂා භාවිතය සම්බන්ධයෙන් ද විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

## 6. පුද්ගල සහ පෞද්ගලික රහස්‍යත්වය.

යම් පුද්ගලයෙකුගේ රහස්‍යත්වයට කිසිදු හෝ ආකාරයකින් හානිවන ආකාරයේ පාඨ, දෘශ්‍ය මාධ්‍ය, සහ රූප සටහන් ආදිය භාවිත නොවිය යුත්තේය.

**6.1.** ළමයින් සහ බාලවයස්කරුවන් සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් ප්‍රවෘත්ති හෝ විශේෂාංග වාර්තාකිරීමේදී පිළිගත් අචාරධර්ම පද්ධතියකට යටත්ව වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් ජනමාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදින් යන මේ සියල්ලන්ම අදාළ අනන්‍යතාවයන් හෙළි නොවන බවට උපරිමයෙන් වගබලාගත යුතුය.

## 7. වෙබ් මාධ්‍ය ආශ්‍රිත පුද්ගලයන්ගේ චර්යාව.

වෙබ් සංස්කාරකවරයෙකු, ප්‍රකාශකවරයෙකු, පරිපාලකවරයෙකු හෝ ඕනෑම ආකාරයක වෙබ් ජනමාධ්‍යයක සේවයෙහි යෙදෙන ජනමාධ්‍යවේදින්/වේදිනියන් යන මේ සියල්ලන්ම සිය වෘත්තිය ගරුත්වය සම්බන්ධයෙන් නිසි සැලකිල්ලකින් සිටිය යුතු අතර පොදු සමාජයේදී ඔහුගේ/ඇයගේ විශ්වාසනීයත්වයට හෝ ගරුත්වයට හානි පමුණුවන, එසේත් නැතහොත් පොදුවේ මාධ්‍ය වෘත්තියෙහි ගරුත්වයට හානි පමුණුවන ආකාරයේ හැසිරීම්වලින් වැලකී සිටිය යුතුය.

## 8. මහජන අභිලාෂයන් ආරක්ෂාකර පවත්වාගෙන යාම.

ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, වාර්ගික සහ ආගමික සහජීවනය, සාමය සහ පරිසරය, අදහස් ප්‍රකාශකිරීමේ නිදහස, සහ මිනිසුන්ගේ සියලුම මානව අයිතිවාසිකම් ආරක්ෂාකිරීමෙහි ද, පුද්ගල කණ්ඩායම්, ප්‍රජාවන් සහ පොදු සමාජයට ඍජුව හෝ වක්‍රව හානි පැමිණවිය හැකි සිදුවීම් හෝ ගැටලු පිළිබඳ මහජනතාව නිරන්තරයෙන් දැනුවත්කිරීමෙහිද, ද්වේෂ සහගත හැසිරීම් ජනිත කරන ආකාරයේ ක්‍රියාකාරීත්වයන්, වාර්ගික හෝ ආගමික ගැටුම්වල පෙළඹවීමේ උත්සාහයන්, අපරාධ, දූෂණ ක්‍රියාවන්, පරිපාලන යාන්ත්‍රණයන්හි අයථා ක්‍රියාවන් බරපතල ආකරයේ වැරදි ක්‍රියාවන්ද හඳුනාගනිමින් ඒවා අනාවරණයකිරීමෙහි ද නිරතවීම මහජන අභිලාෂයන් ආරක්ෂාකිරීමෙහිලා මැදිහත්විය හැකි ආකාරය වශයෙන් පිළිගැනෙනු ඇත.